III ඒකකය

පළිබෝධ කළමනාකරණය

(1) කෘමීන් හා මයිටාවන් අතර ප්‍රධාන වෙනස්කම වනුයේ,

1) කෘමීන්ට බාහිර සැකිල්ලක් තිබෙන නමුත් මයිටාවන්ට බාහිර සැකිල්ලක් නැත.
2) කෘමීන්ට ඛණ්ඩවලට බෙදුන පාද ඇති නමුත් මයිටාවන්ට ඛණ්ඩවලට බෙදුන පාද නැත.
3) කෘමීන් හැව හරින නමුත් මයිටාවන් හැව හරින්නේ නැත.
4) කෘමීන්ට ස්පර්ශක ඇති නමුත් මයිටාවන්ට ස්පර්ශක නැත.
5) කෘමීන්ගේ ශරීරය කොටස් දෙකකට බෙදී ඇති නමුත් මයිටාවන්ගේ ශරීරය කොටස් තුනකට බෙදී ඇත. (2000)

(2) එක්තරා ශාක පටකයක ප්‍රාදේශීය ලප කිහිපයක් නිරීක්ෂණය කරන ලදී. මෙම ලප මැරුණු පටක වූ අතර කහ පැහැයට හුරු කොළ පැහැති දාරයක් වට වී තිබිණි. ඉහත ලක්ෂණවලට අනුව මෙය,

1) දිලීර ආසාදනයකි.
2) බැක්ටීරියා ආසාදනයකි.
3) වයිරස් ආසාදනයකි.
4) නෙමටෝඩා ආසාදනයකි.
5) කායික විද්‍යාත්මක අක්‍රමිකතාවයකි. (2000)

(3) වල් පැළෑටි පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

A) වාර්ෂික වල් පැළ වසරක් තුළ දී බීජ නිපදවයි.
B) ද්විවාර්ෂික වල් පැළ දෙවන වසරේ දී බීජ නිපදවයි.
C) බහුවාර්ෂික වල් පැළ පරිණත වීමෙන් පසු එක් වරක් පමණක් බීජ නිපදවන නමුත් වසර දෙකකට වඩා කාලයක් ජීවත් වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය වනුයේ,

1) A පමණි.
2) B පමණි.
3) C පමණි.
4) A හා B පමණි.
5) A හා C පමණි. (2000)

(4) 2, 4 – D යනු,

1) වල්නාශකයක් වන නමුත් වර්ධක යාමකයක් නොවේ.
2) වල්නාශකයක් මෙන්ම වර්ධක යාමකයක් ද වේ.
3) කෘමිනාශකයක් වන නමුත් වර්ධක යාමකයක් නොවේ.
4) කෘමිනාශකයක් මෙන්ම වර්ධක යාමකයක් ද වේ.
5) ඉහත කිසිවක් නොවේ. (2000)

(5) බෝර්ඩෝ (Bordeaux) මිශ්‍රණය යනු,
1) පටක රෝපණ මාධ්‍යයකි. 2) පොහොර මිශ්‍රණයකි. 3) දිලීර නාශකයකි.
4) කෘමිනාශකයකි. 5) පාංශු ආකලනයකි. (2000)

(6) අඩු LD_{50} අගයක් සහිත කෘමිනාශක අසුරනයක් ලේබල් කර ඇත්තේ,
1) තද රතු පාටෙනි. 2) කොළ පාටෙනි. 3) කහ පාටෙනි.
4) නිල් පාටෙනි. 5) රෝස පාටෙනි. (2001)

(7) පහත දී ඇත්තේ ලංකාවේ දක්නට ඇති වල් පැළෑටි විශේෂ කිහිපයකි.
A) ඇකලිපා ඉන්ඩිකා (*Acalypha indica*)
B) මිමොසො පිග්‍රා (*Mimosa pigra*)
C) පාතේනියම් හිස්ටෙරොපෝරස් (*Partheniam hysterophorus*)
D) වනෝනියා සිනෙරා (*Vernonia cinera*)
E) සයිනොඩොන් ඩැක්ටිලෝන් (*Cynodon dactylon*)
ඉහත විශේෂ අතරෙන් ශ්‍රී ලංකාවට ආගන්තුක ආක්‍රමණකාරී වල් පැළෑටි ලෙස මෑතක දී හඳුනාගත් ශාක වනුයේ,
1) A සහ B පමණි. 2) A සහ C පමණි. 3) A සහ D පමණි.
4) B සහ C පමණි. 5) D සහ E පමණි. (2001)

(8) කෘමි පළිබෝධ කළමනාකරණයේ දී ආර්ථික හානිදායක මට්ටම ලෙස සලකුණු ලබන්නේ,
1) පළිබෝධ ගහණ සමතුලිතව පවතින මට්ටම ය.
2) පළිබෝධයන් විශාල සංඛ්‍යාවක් ලෙස හමුවන මට්ටම ය.
3) පාලන ක්‍රම අනුගමනය කළ යුතු මට්ටම ය.
4) පාලනය සඳහා යන වියදම අධික මට්ටම ය.
5) පළිබෝධයන් ශාක මත යැපීමට පටන් ගන්නා මට්ටම ය. (2001)

(9) ශ්‍රී ලංකාවේ හමුවන වල් පැළෑටි කිහිපයක් පහත දක්වා ඇත.
A) සයිපරස් රොටුන්ඩස් (*Cyperus rotundus*)
B) ඇක්සොනෝපස් කොම්ප්‍රෙසස් (*Axonopus compressus*)
C) ලැන්ටානා කැමරා (*Lantana camara*)
D) ස්ටැචිටපීටා ඉන්ඩිකා (*Stachytarpheta indika*)
ඉහත විශේෂ අතරෙන් පළල් පත්‍ර වල් පැළෑටි ලෙස වර්ග කළ හැක්කේ,
1) A සහ B පමණි. 2) A සහ C පමණි. 3) A සහ D පමණි.
4) B සහ C පමණි. 5) C සහ D පමණි. (2001)

(10) ස්පර්ශ වල්නාශක වඩාත් සුදුසු වනුයේ,
1) වාර්ෂික හා ද්විවාර්ෂික වල් පැළෑටි මර්දනයට පමණි.
2) බල්බ සහිත බහුවාර්ෂික හා වාර්ෂික වල් පැළෑටි මර්දනයට පමණි.
3) ධාවක සහිත බහුවාර්ෂික හා වාර්ෂික වල් පැළෑටි මර්දනයට පමණි.
4) ද්විවාර්ෂික හා බහුවාර්ෂික වල් පැළෑටි මර්දනයට පමණි.
5) වාර්ෂික හා බහුවාර්ෂික වල් පැළෑටි මර්දනයට පමණි. (2002)

(11) *Xanthomonous oryzae* යනු,
1) ශාක පරපෝෂී දිලීරයකි. 2) මෘතෝපජීවී දිලීරයකි. 3) ව්‍යාධිජනක වයිරසයකි.
4) මෘතෝපජීවී බැක්ටීරියාවකි. 5) ශාක ව්‍යාධිජනක බැක්ටීරියාවකි. (2002)

(12) සපාකන මුඛ කොටස් සහිත කෘමි පළිබෝධයන් බෝග ශාකවලට තදබල ලෙස හානි කරනුයේ,
1) වයිරස් රෝග සම්ප්‍රේෂණය මඟිනි. 2) සෛලය ශුෂය උරාබීමෙනි.
3) බැක්ටීරියා රෝග සම්ප්‍රේෂණය මඟිනි. 4) ප්‍රභාසංශ්ලේෂක පටක ඉවත් කිරීමෙනි.
5) ප්ලෝයම පටකය ඇහිරීමෙනි. (2002)

(13) පයිරත්‍රින් අඩංගු වන්නේ,
1) පැඟිරි තණ (*Cymbopogon nardus*) 2) සින්කෝනා (*Cinchona ledgeriana*)
3) කෝමාරිකා (*Aloe vera*) 4) දුම්කොළ (*Nicotiana tabacum*)
5) කපුරු (*Chrysanthemum cinerariaefolium*) (2002)

(14) ද්විවාර්ෂික වල් මර්දනයට වඩාත් සුදුසු ක්‍රමය වනුයේ,
1) වර්ෂා කාලය ආරම්භවීමට පෙර වල් පැළ පිළිස්සීම ය.
2) බෝග සිටුවීමට පෙර ස්පර්ශ වල්නාශක යෙදීම ය.
3) බිම් සැකසීමට පෙර වල් ගැසීම ය.
4) වල් පැළවල ජීවන චක්‍රයේ පළමු වර්ෂයේ දී ගලවා දැමීම ය.
5) ඉහත කිසිවක් නොවේ. (2003)

(15) පැළ කීඩෑවා අයත් වන් ග්‍රෝත්‍රය,
1) ඩමෙප්ටෙරා වේ. 2) ඩික්ටියොප්ටෙරා වේ. 3) ඕතොප්ටෙරා වේ.
4) හෙටරොප්ටෙරා වේ. 5) හෝමෝප්ටෙරා වේ. (2003)

(16) ගොවියෙකු තම එළවළු වගාවෙහි මෘදු කුණුවීමේ තත්ත්වයක් (Soft–rot condition) වර්ධනය වන බව නිරීක්ෂණය කළේ ය. ඔහු රෝගයට පාත්‍ර වූ ශාකයක කඳ කොටසක් කපා ජලය වීදුරුවක තැබූ පසු කඳේ කපන ලද මතුපිටෙන් ස්‍රාවයක් පිටවන බව නිරීක්ෂණය කළේය. මෙම රෝගයට හේතුකාරක වූනයේ,
1) නෙමටෝඩාවන් ය. 2) දිලීර ය. 3) වයිරස් ය.
4) ප්‍රෝටොසෝවාවන් ය. 5) බැක්ටීරියාවන් ය. (2003)

(17) සූක්ෂ්ම එළවළු බෝග වගා කරන බිමක ඇති ප්‍රධාන භූගත ජල දූෂණකාරක වනුයේ,
1) පොස්පේට් සහ පළිබෝධනාශක 2) පළිබෝධනාශක සහ නයිට්රේට් වේ.
3) ඇමෝනියම් නයිට්‍රජන් සහ ෆොස්ෆේට් වේ. 4) කැල්සියම් සහ ෆොස්ෆේට් වේ.
5) ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය වේ. (2003)

(18) සංකීර්ණ බහුවාර්ෂික වල් පැළ පාලනය සඳහා වඩාත් කාර්යක්ෂම ක්‍රමය වනුයේ,
1) සියල්ල නසන වල්නාශයකයක් යෙදීම ය. 2) තෝරා නසන වල්නාශකයක් යෙදීම ය.
3) ස්පර්ශ වල්නාශකයක් යෙදීම ය. 4) පශ්චාත් – නිර්ගමන වල්නාශකයක් යෙදීම ය.
5) පරිසංක්‍රමණ වල්නාශකයක් යෙදීම ය. (2004)

(19) පළිබෝධ පාලනයේ දී විලෝපිකයන්, පරපෝෂිතයන් හා තරඟකරුවන් යොදා ගැනීම අර්ථ දක්වෙන්නේ,
1) ඒකාබද්ධ පළිබෝධ පාලනය ලෙස ය.
2) ද්විතීයික පළබෝධ වසංගත ලෙස ය.
3) කෘෂි පළිබෝධ පාලනයේ සාර්ථක ක්‍රම ලෙස ය.
4) වගා ක්‍රම මඟින් පළිබෝධ පාලනය ලෙස ය.
5) ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලනය ලෙස ය. (2004)

(20) වරක් උරාගත් පසු සමහර විෂ සංයෝග විවිධ ජීවීන්ගේ පටක තුළ දිග කාලයක් රැඳී පවතී. ආහාර දාමයේ ඉහළ සිටින ජීවීන්ට හා මිනිසාට මෙම දූෂණකාරකවලින් හානි සිදුවීමේ අවදානමක් ඇත. මෙය සිදුවන්නේ,
1) පරිසංක්‍රමණය (translocation) මගිනි.
2) සංයුක්ත අපවිත්‍රනය (compound contamination) මගිනි.
3) ශේෂ බලපෑම් (residual effect) මගිනි.
4) ජෛව හායනය (biodegradation) මගිනි.
5) ජෛව විශාලනය (biomagnification) මගිනි. (2004)

(21) ක්ලෝරිනේටඩ් හයිඩ්‍රොකාබන පළිබෝධනාශකවලට වඩා ඕර්ගනික් පොස්පේට් පළිබෝධනාශක ජනප්‍රිය වී ඇත්තේ ඕර්ගනික් පොස්පේට්,
1) වඩාත් විෂ සහිත නිසා ය.
2) යෙදීමට පහසු නිසා ය.
3) යනු අර්ධ ජීව කාලය කෙටි පළිබෝධනාශකයක් නිසා ය.
4) මගින් ගොවිපොළ සේවකයාට ඇති කරන බලපෑම අඩු නිසා ය.
5) ස්වාභාවික සතුරන් නොමරන නිසා ය. (2004)

(22) යම් පළිබෝධකයකු සඳහා ආර්ථික අවධි මට්ටම (economic threshold level) වනුයේ,
1) පළිබෝධ හානිය හා හානිය නැවැත්වීමට යන වියදම සමාන වන අවස්ථාව ය.
2) පළිබෝධ හානිය ප්‍රතිකර්ම මගින් ආර්ථික හානිදායක මට්ටමට පත්වීම වැළැක්විය හැකි ඉහළම පළිබෝධ ඝනත්වය වේ.
3) අස්වැන්නට ආර්ථික හානියක් වීම සඳහා පළිබෝධ ගහණය ඉක්මවිය යුතු මට්ටම ය.
4) පාලනය කිරීමට වැයවන වියදමට සමාන හානියක් සිදු කරන පළිබෝධ ඝනත්වය ය.
5) සැමවිටම ආර්ථික හානිදායක මට්ටමට වැඩි අවස්ථාව ය. (2004)

(23) සම්පූර්ණ රූපාන්තරණය දක්වන කෘමියෙකු පාලනය කිරීම සඳහා සාමාන්‍යයෙන් වඩාත් උචිත අවස්ථාව වනුයේ,
1) කීට අවස්ථාව ය.
2) බිත්තර අවස්ථාව ය.
3) ශිශු අවස්ථාව ය.
4) පුහුඹුල් අවස්ථාව ය.
5) පිළා අවස්ථාව ය. (2005)

(24) වරණීය වල්නාශක,
1) සියලුම ශාක විශේෂවල වර්ධනය බාල කිරීම හෝ මැරීම සිදු කරයි.
2) සමහර ශාක විශේෂ පමණක් මරයි.
3) ශාකවල වායව කොටස් පමණක් මරයි.
4) සැමවිටම ශාකයට උරා ගන්නේ මුල් මගිනි.
5) සැමවිටම බෝග සංස්ථාපනයට පෙර යොදනු ලබයි. (2005)

(25) සමහර දිලීර, සජීවී පටක මත පමණක් යැපෙයි. මෙම දිලීර කාණ්ඩය වඩාත් හොඳින් හැඳින්විය හැක්කේ,
1) මෘතෝපජීවී ලෙස ය.
2) පරපෝෂිත ලෙස ය.
3) වෛකල්පික පරපෝෂිත ලෙස ය.
4) අනිවාර්ය පරපෝෂිත ලෙස ය.
5) අනිවාර්ය මෘතෝපජීවී ලෙස ය. (2005)

(26) තෙල්වල පොඟවන ලද පරණ සිවුරු පිලිස්සීම, බෝග වගා ක්ෂේත්‍රවල පළිබෝධ පාලනය කිරීමේ සම්ප්‍රදායික ක්‍රමයකි. මෙම පළිබෝධ පාලන ක්‍රමය වඩාත් ඵලදායි වනුයේ,
1) මීයන් වැනි මහා පළිබෝධ පාලනයට ය.
2) මයිටාවන් පාලනයට ය.
3) ලෙපිඩොප්ටෙරාවන් පාලනයට ය.
4) මෘද්වංශිකයන් (mollusca) පාලනයට ය.
5) කවචයන් (crustaceans) පාලනයට ය. (2006)

(27) පාලනයට වඩාත් අපහසු වල් පැළෑටි කාණ්ඩය වනුයේ,
1) වාර්ෂික වල් පැළෑටි ය.
2) ද්විවාර්ෂික වල් පැළෑටි ය.
3) සරල බහුවාර්ෂික වල් පැළෑටි ය.
4) සංකීර්ණ බහු වාර්ෂික වල් පැළෑටි ය.
5) ඒකබීජ පත්‍රී වල් පැළෑටි ය. (2006)

(28) *Phytopthora infestans* යනු,
1) ශාකවල රෝග ඇති කරන බැක්ටීරියාවකි.
2) පළිබෝධ පාලනයට යොදා ගනු ලබන බැක්ටීරියාවකි.
3) නිවර්තන කලාපීය පසෙහි සිටින නයිට්‍රජන් තිර කරන බැක්ටීරියාවෙකි.
4) ශාකවල රෝග ඇති කරන දිලීරයකි.
5) පළිබෝධ පාලනයට යොදා ගනු ලබන දිලීරයකි. (2006)

(29) ශාකයක පත්‍ර මත ප්‍රාදේශිකව ඇති වූ වෘත්තාකාර ලප කිහිපයක් තිබෙනු ශිෂ්‍යයෙක් නිරීක්ෂණය කළේ ය. මෙම ලප තුළ පැහැති කොළ පැහැයට හුරු දාරවලින් වට වූ මැරුණු පටක විය. ඉහත ලක්ෂණ අනුව මෙම තත්ත්වය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,
1) කායික විද්‍යාත්මක තත්ත්වයක් ලෙස ය.
2) පෝෂණ ඌනතාවක් ලෙස ය.
3) බැක්ටීරියා ආසාදනයක් ලෙස ය.
4) දිලීර ආසාදනයක් ලෙස ය.
5) වයිරස් ආසාදනයක් ලෙස ය. (2007)

(30) මෑතක දී ශ්‍රී ලංකාවේ හඳුනාගත් ආගන්තුක ආක්‍රමණශීලී වල් පැළෑටියකට උදාහරණයක් වනුයේ කුමක් ද?
1) *Cassia occidentails*
2) *Parthenium hysterophorus*
3) *Vernonia cinera*
4) *Acalypha indica*
5) *Cynodon dactylon* (2007)

(31) හපා කන මුඛ කොටස් සහිත කෘමීන්ගෙන් ශාකයකට සිදුවන ප්‍රධාන හානිය වනුයේ,
1) වයිරස් රෝග සම්ප්‍රේෂණය වීම ය.
2) සෛල යුෂ උරාබීම ය.
3) බැක්ටීරියා රෝග සම්ප්‍රේෂණය වීම ය.
4) ජලෝයම පටක අවහිර කිරීම ය.
5) ප්‍රභාසංස්ලේෂක පටක ඉවත් කිරීම ය. (2007)

(32) ආහාර ගන්නා අතරතුර දී ශාකවලට වයිරස් සහ බැක්ටීරියා බෝකරන කෘමීන් වනුයේ,
1) දළඹුවන් ය.
2) කුඩිත්තන් ය.
3) කුරුමිණියන් ය.
4) සලබයන් ය.
5) මකුළුවන් ය. (2008)

(33) අර්ධ ජලජ, ආක්‍රමණික ශාකයකට උදාහරණයකි.
1) *Salvinia molesta*
2) *Eichhornia crassipes*
3) *Pistia staratiotes*
4) *Mimosa pigra*
5) *Lantana camara* (2008)

(34) ගොවියෙකු භාවිත කළ වල්නාශකයක පහත සඳහන් ගති ලක්ෂණ තිබිණි.
A – තෘණ පාලනය කරයි.
B – පත්‍ර මඟින් උරා ගනී.
C – වල්නාශකය යොදා සති දෙකකට පසු එහි ක්‍රියාකාරීත්වයේ ලක්ෂණ දැකිය හැකි ය.
ඉහත සඳහන් තොරතුරුවලට අනුව මෙය,
1) තෝරා තෘණ වර්ග මර්දනය කරන, පූර්ව නිර්ගමන, ස්පර්ශ වල්නාශකයකි.
2) තෝරා තෘණ වර්ග මර්දනය කරන, පූර්ව නිර්ගමන, සංස්ථානික වල්නාශකයකි.
3) තෝරා නසන, පසු නිර්ගමන, ස්පර්ශ වල්නාශකයකි.
4) තෝරා නසන, පසු නිර්ගමන, සංස්ථානික වල්නාශකයකි.
5) තෝරා නසන, පත්‍ර මත යොදන (foliar applied) ස්පර්ශ වල්නාශකයකි. (2008)

(35) පහත සඳහන් ඔර්ගනෝක්ලෝරීන් අතුරෙන් දීර්ඝතම අර්ධ ජීව කාලයක් වාර්තා වී ඇත්තේ,
1) ඇල්ඩ්‍රින්වල ය. (aldrin)
2) ක්ලෝඩේන්වල ය. (chlordane)
3) D.D.T වල ය.
4) එන්ඩ්‍රින්වල ය. (endrin)
5) ඔක්සික්ලෝඩේන්වල ය. (Oxychlordane) (2009)

(36) ආක්‍රමණකාරි ජලජ පර්නාංගයකට උදාහරණයක් වන්නේ,
1) වෝටර් හයිසින්ත් (*Eichhorria crassipes*) ය.
2) ඇලිගේටර් (*Alternanthera philoxeroides*) ය.
3) සැල්වීනියා (*Salvinia molesta*) ය.
4) දිය හවරි (*Pistia stratiotes*) ය.
5) ලැජෙනැන්ඩ්‍රා (*Lagenandra ovatu*) ය. (2009)

(37) එක්තරා වල් නාශකයක පොදු ලක්ෂණයක් වනුයේ, එය පසට පොදු මාස 2 ක් හෝ වැඩි කාලයක් සක්‍රීයව පැවතීම ය. මෙම වල් නාශකය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,
1) සංස්ථානික වල් නාශකයක් ලෙස ය.
2) වරණීය වල් නාශකයක් ලෙස ය.
3) පූර්ව – නිර්ගමන වල් නාශකයක් ලෙස ය.
4) ස්පර්ශ වල් නාශකයක් ලෙස ය.
5) පශ්චාත් නිර්ගමන වල් නාශකයක් ලෙස ය. (2010)

(38) මකුළුවන්, කෘමීන්ගෙන් වෙනස් වන්නේ ඔවුන්ට,
1) පාද හයක් හා අපැහැදිලි දේහ ඛාණ්ඩ දෙකක් ඇති බැවිනි.
2) පාද හයක් හා පැහැදිලිව වෙන් වූ දේහ ඛාණ්ඩ තුනක් ඇති බැවිනි.
3) පාද අටක් හා පැහැදිලිව දේහ ඛාණ්ඩ තුනක් ඇති බැවිනි.
4) පාද අටක් හා අපැහැදිලි දේහ ඛාණ්ඩ දෙකක් ඇති බැවිනි.
5) පාද අටක් හා පැහැදිලිව වෙන් වූ දේහ ඛාණ්ඩ දෙකක් ඇති බැවිනි. (2010)

(39) පළිබෝධ නාශක නිෂ්පාදනයක ලේබලය,
1) භාවිතයට පෙර කියවා තේරුම් ගත යුතු ය.
2) යොදා ඇත්තේ එය පළමුවරට භාවිත කරන්නන්ට උපදෙස් දීමේ අරමුණෙනි.
3) මිල දී ගැනීමේ අවස්ථාවේ දී සම්පූර්ණයෙන්ම කියවිය යුතු ය.
4) තුළ අඩංගු වන්නේ මිශ්‍ර කිරීමේ උපදෙස් හා එහි ඇති ක්‍රියාකාරී ද්‍රව්‍යවල ලැයිස්තුවක් පමණි.
5) මඟින් සපයනු ලබන්නේ ගොවීන්ට ප්‍රයෝජනවත් වන තොරතුරු පමණි. (2010)

(40) අ.පො.ස උසස් පෙළ කෘෂි විද්‍යාව හදාරන ශිෂ්‍යයෙකුගේ ක්ෂේත්‍ර සටහන් පොතකින් පහත සටහන හමුවිය. ''එක් වසරක ජීවන චක්‍රයක් සහිත, දේශීය නොවන, ආක්‍රමණශීලී, පත්‍රමය ශාකයක්''මෙම ශාකය වඩාත්ම හොඳින් විස්තර කළ හැක්කේ,

1) වාර්ෂික ක්ෂේත්‍ර බෝගයක් ලෙස ය.
2) විදේශීය පත්‍රමය එළවළුවක් ලෙස ය.
3) හඳුන්වාදෙන ලද වාර්ෂික වාණිජ බෝගයක් ලෙස ය.
4) වාර්ෂික වල් පැළෑටියක් ලෙස ය.
5) හඳුන්වාදෙන ලද පෝෂ බෝගයක් ලෙස ය. (2010)

(41) සාර්ථක වල්පැළෑටි පාලන වැඩ සටහනකට අවශ්‍ය වන්නේ,

A – වල්පැළෑටි හඳුනා ගැනීම සහ ඒවායේ ජීවන චක්‍ර අවබෝධ කර ගැනීම ය.
B – පාත්ති නිසි ලෙස සකස් කර ගැනීම ය.
C – වල් නාශකවලට අතිරේකව, රෝපණ සහ යාන්ත්‍රික ක්‍රම අනුගමනය කිරීම ය.
D – අඛණ්ඩව වල්නාශක යෙදීම ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

1) A, B සහ C පමණි.
2) A, B සහ D පමණි.
3) A, C සහ D පමණි.
4) B,C සහ D පමණි.
5) A, B, C සහ D යන සියල්ලම ය. (2010)

(42) පහත ප්‍රකාශ අතරින් පළිබෝධ නාශක යෙදූ ක්ෂේත්‍රයට නැවත ඇතුළුවීම සම්බන්ධයෙන්, හොඳම උපදේශය වන්නේ,

1) පළිබෝධ නාශක යෙදීමෙන් සති 2 ක් යනතුරු ක්ෂේත්‍රයට ඇතුළු නොවිය යුතු ය.
2) පළිබෝධ නාශක යෙදූ විගස ක්ෂේත්‍රයට ඇතුළු විය හැකි ය.
3) අස්වනු නෙළීම සඳහා පමණක් ක්ෂේත්‍රයට ඇතුළු විය යුතු ය.
4) ක්ෂේත්‍රය වියළී ගිය පසු ඇතුළු විය හැකි ය.
5) ඊළඟ පළිබෝධ නාශක යෙදීම තෙක් ක්ෂේත්‍රයට ඇතුළු නොවිය යුතු ය. (2010)

(43) පළිබෝධනාශක විවිධ ආකාරවලින් (formulations) දක්නට ලැබෙන අතර, තෛලෝදකෘත සාන්ද්‍රණ (Emulsifiable Concentrates (EC) යනු ඉන් එක් ආකාරයකි. වෙළඳපොළෙහි (EC) දැකිය හැක්කේ,

1) කුඩු වශයෙනි.
2) දියර වශයෙනි.
3) කණිකා වශයෙනි.
4) තෙත් කළ හැකි කුඩු වශයෙනි.
5) කුට්ටි වශයෙනි. (2011)

(44) ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණයේ දී,

1) ශාකසාර පමණක් භාවිතයට ඉඩ දේ.
2) තුන්වන පරම්පරාවේ පළිබෝධනාශක පමණක් භාවිතයට ඉඩ දේ.
3) ඕර්ගනෝ පොස්පේට් පමණක් භාවිතයට ඉඩ දේ.
4) පළිබෝධනාශක භාවිතයට ඉඩ නොදේ.
5) අවශ්‍ය ම අවස්ථාවක පමණක් පළිබෝධනාශක භාවිතයට ඉඩ දේ. (2011)

(45) ශාකයෙන් ශාකයට රෝග කාරකයන් රැගෙන යන්නේ,

1) ව්‍යාධිජනකයින් ය.
2) පරපෝෂිතයින් ය.
3) විලෝපිකයින් ය.
4) වාහකයින් ය.
5) පළිබෝධ ය. (2011)

(46) කෘෂිකර්මයේ දී ඉවක් බවක් නැතිව පළිබෝධ නාශක භාවිතයෙන්,

A – පළිබෝධ ප්‍රතිරෝධීතාව (resistance) ඇති වේ.
B – පළිබෝධ නැවත ඇති වීම (resurgence) සිදු වේ.
C – පරිසර දූෂණය සිදු වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

1) A පමණි.
2) A හා B පමණි.
3) A හා C පමණි.
4) B හා C පමණි.
5) A,B හා C යන සියල්ලම. (2011)

(47) වල් පැළෑටියක් නිරීක්ෂණය කළ ශිෂ්‍යයෙක් එහි ලක්ෂණ පහත පරිදි වාර්තා කළේ ය.
- ➢ පටු සිරස්ව වැඩුණු පත්‍ර ඇත.
- ➢ පත්‍රය දිගටම පිහිටා ඇති සමාන්තර නාරටි ඇත.
- ➢ ප්‍රරෝහණයේ දී එක් පත්‍රයක් පමණක් දක්නට ලැබේ.
- ➢ තන්තුමය මූල පද්ධතියක් ඇත.

මෙම වල් පැළෑටිය,
1) *Acalypha indica* (කුප්පමේනිය) වේ. 2) *Aerva lanata* (පොල්පලා) වේ.
3) *Amaranthus viridis* (කුර තම්පලා) වේ. 4) *Crotalaria juncea* (අඩනාහිරියා) වේ.
5) *Axonopus compressus* (පොල්තණ) වේ. (2011)

(48) ජිහ්වලයක් සහිත දිගටි සිහින් පත්‍ර ඇති ඒකබීජපත්‍රී වල් පැළෑටියක් ශිෂ්‍යයකුට හමුවිණි. මෙම වල් පැළෑටිය වඩාත් නිරවද්‍යව හැඳින්විය හැක්කේ,
1) තෘණ ශාකයක් ලෙස ය. 2) පන් ශාකයක් ලෙස ය. 3) වාර්ෂික ශාකයක් ලෙස ය.
4) බහු වාර්ෂික ශාකයක් ලෙස ය. 5) පළල් පත්‍ර ශාකයක් ලෙස ය. (2012)

(49) පළිබෝධනාශක නිපදවන ලද වෙළඳ සමාගම කුමක් වුව ද පළිබෝධනාශක ලේබලයක **නොවෙනස්ව** පවතින නාමය / නාම වනුයේ,
1) සන්නාමය වේ. 2) රසායනික නාමය වේ. 3) පොදු නාමය වේ.
4) සන්නාමය හා රසායනික නාමය වේ. 5) රසායනික නාමය සහ පොදු නාමය වේ. (2012)

(50) පූර්ණ රූපාන්තරණය දක්වන කෘමි ගෝත්‍ර වනුයේ,
1) ඩිප්ටෙරා, කෝලියොප්ටේරා සහ හෙමිප්ටෙරා වේ.
2) ලෙපිඩොප්ටෙරා, ඩිප්ටෙරා සහ කෝලියොප්ටේරා වේ.
3) කෝලියොප්ටේරා, හොමොප්ටෙරා සහ හෙමිප්ටෙරා වේ.
4) ඕතොප්ටෙරා, ලෙපිඩොප්ටෙරා සහ කෝලියොප්ටේරා වේ.
5) හොමොප්ටෙරා, හෙමිප්ටෙරා සහ තයිසනොප්ටෙරා වේ. (2012)

(51) විදින හා යුෂ උරාබොන කෘමි පළිබෝධයින් වාර්තා වන ගෝත්‍ර වනුයේ,
1) හොමොප්ටෙරා, හෙමිප්ටෙරා සහ ඩිප්ටෙරා වේ.
2) ඕතොප්ටෙරා, කෝලියොප්ටේරා සහ ඩිප්ටෙරා වේ.
3) ලෙපිඩොප්ටෙරා, ඕතොප්ටෙරා සහ ඩිප්ටෙරා වේ.
4) කෝලියොප්ටේරා, හොමොප්ටෙරා සහ හෙමිප්ටෙරා වේ.
5) ලෙපිඩොප්ටෙරා, හොමොප්ටෙරා සහ හෙමිප්ටෙරා වේ. (2012)

(52) වාර්ෂික වල් පැළෑටිවලට උදාහරණ වනුයේ,
1) *Fimbristylis mileacea, Ischaemum rugosum* සහ *Panicum repens*.
2) *Cyperus rotundus, Fimbristylis mileacea* සහ *Leptochloa chinensis*.
3) *Cyperus rotundus, Echinochloa crusgalli* සහ *Leptochloa chinensis*.
4) *Echinochloa crusgalli, Leptochloa chinensis* සහ *Fimbristylis mileacea*.
5) *Parthenium hysterophorus, , Ischaemum rugosum* සහ *Panicum repens*. (2012)

(53) ශාක රෝග,
1) ජෛවීය කාරකයන්ගෙන් සෑදේ.
2) ශාකයට නිරන්තරයෙන් පීඩා ගෙන දේ.
3) අඛණ්ඩ දිලීරනාශක යෙදීම මගින් වළක්වා ගත හැකි ය.
4) ශාකයක සාමාන්‍ය ක්‍රියාකාරිත්වයට බාධා වීමක් ලෙස සැලකිය හැකි ය.
5) පාංශු pH අගය 6.5 සිට 7.5 පරාසය තුළ පවත්වා ගැනීමෙන් පාලනය කළ හැකි ය. (2012)

(54) පහත සඳහන් යුගල අතරින් වඩාත් ගැළපෙන යුගලය වනුයේ,
1) *Mimosa pigra* – නිදහසේ පාවෙන වල් පැළෑටි
2) *Echinochloa crusgalli* – ජිහ්විකාවක් රහිත තෘණ වල් පැළෑටි
3) *Salvinia molesta* – පරපෝෂිත වල් පැළෑටි
4) *Cusucta campestris* – අර්ධ ජලජ වල් පැළෑටි
5) *Alternanthera philoxerodes* – බහු වාර්ෂික පන් ශාක (2013)

(55) බෝගයක අස්වනු නෙළීමට යම් කාලයකට පෙර පළිබෝධනාශක යෙදීම නැවත්වීමට නිර්දේශ කරනු ලබන්නේ,
1) පළිබෝධයන් මැරීම සඳහා පළිබෝධනාශකයකට කාලයක් දිය යුතු නිසා ය.
2) පළිබෝධනාශකය උරා ගැනීම සඳහා ශාකයට කාලයක් ලබා දිය යුතු නිසා ය.
3) පළිබෝධනාශකය හායනය වීමට කාලයක් ලබා දිය යුතු නිසා ය.
4) පළිබෝධනාශකයකට ශාකය තුළ ගමන් කිරීමට කාලයක් ලබා දිය යුතු නිසා ය.
5) ඵලය ඉදීමට කාලයක් ලබා දිය යුතු නිසා ය. (2013)

(56) පාලනය කිරීමට ඉතාමත් අපහසු ශාක රෝග කාණ්ඩයක් ලෙස වයිරස් රෝග සැලකේ. වයිරස් ගුණනය වන්නේ,
1) පසෙහි පමණි. 2) මළ පටක තුළ පමණි. 3) සජීවී පටක තුළ පමණි.
4) ජලයේ පමණි. 5) වාතයේ පමණි. (2013)

(57) ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණ ක්‍රියාවල දී,
1) පළිබෝධනාශක භාවිතය තහනම් ය. 2) විශාල වශයෙන් පළිබෝධනාශක මත යැපේ.
3) සියලුම පළිබෝධ පාලන ක්‍රම භාවිත කරයි. 4) ජෛව පාලනයට ප්‍රමුඛතාව දෙනු ලැබේ.
5) සියල්ල නසන පළිබෝධනාශක භාවිතයට ඉඩ නොදේ. (2013)

(58) වඩාත් විෂ රසායනික දක්වන LD_{50} අගය වන්නේ,
1) 0.05 2) 0.50 3) 1.00 4) 1.50 5) 2.00 (2013)

(59) කෘමීන් හඳුනා ගැනීමේ යතුරු මූලික වශයෙන් පදනම් වී ඇත්තේ,
1) කෘමීන්ගේ හැසිරීමේ වෙනස්කම් හා සමානතා මත ය.
2) කෘමීන්ගේ වර්ණයේ වෙනස්කම් හා සමානතා මත ය.
3) කෘමීන්ගේ කායික විද්‍යාත්මක වෙනස්කම් හා සමානතා මත ය.
4) කෘමීන්ගේ රූපාකාරයේ වෙනස්කම් හා සමානතා මත ය.
5) කෘමීන්ගේ ජීවන චක්‍රයේ දිගෙහි වෙනස්කම් හා සමානතා මත ය. (2013)

➢ **ප්‍රශ්න අංක 60 ට පිළිතුරු දීම සඳහා පහත රූප සටහන යොදා ගන්න.**

(60) ඉහත රූප සටහෙනහි,



1) A හා B දෙදෙනාම කෘමීන් ය.
2) A හා B දෙදෙනාම කෘමීන් නොවන සතුන් ය.
3) A කෘමියෙකු වන අතර B කෘමියෙකු නොවේ.
4) A කෘමියෙකු නොවන අතර B කෘමියෙකි.
5) A සුහුඹුලෙකු වන අතර B ශිශුවෙකි. (2013)

(61) පළිබෝධක පාලනය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශනය වනුයේ,
1) කෘමි පළිබෝධීන් උපරිම ගහන ඝනත්වයට ළඟා වූ ලබන ජීව විද්‍යාත්මක කෘමිනාශකයකි.
2) Bacillus thuringiensis යනු කෘෂිකර්මාන්තයේ දී යොදා ගනු ලබන ජීව විද්‍යාත්මක කෘමි නාශකයකි.
3) පයරෙත්‍රොයිඩ් යනු දිලීර ව්‍යාධිජනකයන් විනාශ කරන සංයෝගයකි.
4) පළිබෝධනාශකවල උපරිම ක්‍රියාකාරීත්වයට සඳහා එය කෘමීන් විසින් ආහාරයට ගත යුතුය.
5) කෘමිනාශක, සාමාන්‍යයෙන් වල්නාශකවලට වඩා මිනිසාට විෂ අඩු ය. (2014)

(62) ගොවිපළක නැප්සැක් ඉසිනයක් භාවිතාව සම්බන්ධ පහත ක්‍රියාවන් කෙරෙහි අවධානය යොමු කරන්න.
A – ඉසිනය සෝදා පිරිසිදු කිරීම
B – ඉසිනය ක්‍රමාංකනය කිරීම
C – පළිබෝධනාශක දියරය ඉසිනයට පිරවීම
D – පිරිසිදු ජලය යොදා ගනිමින් ඉසිනයේ කාන්දුවීම් පරීක්ෂා කිරීම
E – අවශ්‍ය පමණට පීඩනය ලබා ගැනීමට වාතය පිරවීම
F – ඒකාකාර ලෙස යෙදීම සහතික කර ගැනීම
අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රියා අනුපිළිවෙල වනුයේ,
1) A, B, C, D, E, F 2) B, C, A, F, E, D 3) C, B, D, E, A,F
4) D, B, C, E, F, A 5) E, F, D, C, A, B (2014)

➢ ශිෂ්‍යයෙකු විසින් එක්තරා පළිබෝධයෙකුගේ ගහන මට්ටම මනින ලදුව පහත ප්‍රස්ථාරයේ පරිදි සටහන් කර ඇත. ප්‍රශ්න අංක 63 ට පිළිතුරු දීමට මෙම ප්‍රස්තාරය යොදා ගන්න.



(63) මෙම පළිබෝධයා පාලනයට රසායනික ක්‍රම යෙදිය යුතු වන්නේ,
1) P හි දීය. 2) Q හි දීය. 3) R හි දීය. 4) S හි දීය. 5) T හි දීය. (2014)

(64) බොහෝ දිලීර රෝග පැතිරීම සිදු වන්නේ,
1) සිසිල් හා වියළි කාලගුණ තත්ත්වයේ දී ය.
2) සිසිල් හා තෙත් කාලගුණ තත්ත්වයේ දී ය.
3) උණුසුම් හා වියළි කාලගුණ තත්ත්වයේ දී ය.
4) උණුසුම් හා තෙත් කාලගුණ තත්ත්වයේ දී ය.
5) සෞම්‍ය හා වියළි කාලගුණ තත්ත්වයේ දී ය.
(2014)

➢ ප්‍රශ්න අංක 65 ට පිළිතුරු දීම සඳහා ප්‍රධාන වී පළිබෝධයෙකුගේ පහත ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරන්න.

"කුඩා වී පැළවලට හානි කරන පළිබෝධයෙකි. සුහුඹුලා හා කීටයා පත්‍ර පටකවලින් සෛල යුෂ උරා බොයි. හානි වූ පත්‍ර දාර දිගේ ඇතුල් පැත්තට රෝල් වේ. යුෂ උරා බීම නිසා පත්‍ර වියළී බෝග වර්ධනය දුර්වල වේ. ජලය හිඟ තත්ත්වයවල දී හානිය තීව්‍ර වේ"

(65) ඉහත විස්තරයෙන් හැඳින්වෙන කෘමි පළිබෝධකයා වනුයේ,
1) ගොයම් පැළ මැක්කා ය. 2) දුඹුරු පැළ කීඩෑවා ය. 3) පුරක් පණුවා ය.
4) ගොයම් කොළ හකුලන්නා ය. 5) Gall midge ය.
(2014)

(66) පළිබෝධ පාලනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – පැරක්වට් යනු ශ්‍රී ලංකාව තුළ භාවිතය තහනම් කළ වල්නාශකයකි.
B – ඒකාබද්ධ පළිබෝධ පාලනය තුළින් කෘමි පළිබෝධ සහමුලින් ම විනාශ කෙරේ.
C – අඛණ්ඩව පළිබෝධනාශක භාවිතය, ප්‍රතිරෝධී පළිබෝධ ගහනයන් ඇති වීමට උපකාරී වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
1) A පමණි. 2) B පමණි. 3) A හා B පමණි.
4) A හා C පමණි. 5) B හා C පමණි.
(2014)

➢ ප්‍රශ්න අංක 67 සහ 68 ට පිළිතුරු සැපයීම සඳහා පහත වල් පැළ නාම යොදා ගන්න.
A – *Echinochloa crus – galli* B – *Cyperus iria* C – *Leptochloa chinensis*
D – *Ischaemum rugosum* E – *Fimbristylis miliacea*

(67) පොඒසියේ කුලයට අයත් වල් පැළ වනුයේ,
1) A හා B පමණි. 2) B හා C පමණි. 3) C හා D පමණි.
4) A, C හා D පමණි. 5) B, C හා E පමණි.
(2015)

(68) C_4 ප්‍රභාසංස්ලේෂණය සහිත වල් පැළ වනුයේ,
1) A, B හා C පමණි. 2) A, C හා D පමණි. 3) A, C හා E පමණි.
4) B, C හා D පමණි. 5) B, C හා E පමණි. (2015)

➢ ප්‍රශ්න අංක 69 සහ 70 ට පිළිතුරු සැපයීම සඳහා පහත කෘමි ගෝත්‍ර යොදා ගන්න.
A – ලෙපිඩොප්ටෙරා B – ඩිප්ටෙරා C – කෝලියොප්ටෙරා
D – හෝමොප්ටෙරා E – හෙමිප්ටෙරා

(69) පූර්ණ රූපාන්තරණය දක්වන කෘමීන් අයත් ගෝත්‍ර වනුයේ,
1) A, B හා C පමණි. 2) A, C හා D පමණි. 3) A, D හා E පමණි.
4) B, C හා D පමණි. 5) B, D හා E පමණි. (2015)

(70) විද පුෂ උරා බොන මුඛ කොටස් සහිත කෘමීන් අයත් ගෝත්‍ර වනුයේ,
1) A, B හා C පමණි. 2) A, C හා D පමණි. 3) A, D හා E පමණි.
4) B, C හා D පමණි. 5) B, D හා E පමණි. (2015)

➢ ප්‍රශ්න අංක 71 සහ 72 ට පිළිතුරු සැපයීම සඳහා පහත කෘමි ගෝත්‍ර යොදා ගන්න.
A – මුල් තැම්බෙන රෝගය (Damping off)
B – රබර්වල සුදු මුල් රෝගය (White root disease of Rubber)
C – කැරට් මෘදු කුණු වීම (Sort rot in Carrot)
D – බුලත්වල පත්‍ර ලප රෝගය (Leaf spot discase in Betel)

(71) බැක්ටීරියාතු රෝග සඳහා උදාහරණය වනුයේ,
1) A හා B පමණි. 2) B හා D පමණි. 3) C හා D පමණි.
4) A, C හා D පමණි. 5) B, C හා D පමණි. (2015)

(72) පාංශු ජනන රෝග සඳහා උදාහරණ වනුයේ,
1) A හා B පමණි. 2) B හා D පමණි. 3) C හා D පමණි.
4) A, C හා D පමණි. 5) B, C හා D පමණි. (2015)

(73) මොනොක්‍රොටපස් කෘමිනාශකය අඩංගු බෝතලයක අලවා ඇති ලේබලයේ පහළ දාරයේ වර්ණය විය යුත්තේ,
1) රතු ය. 2) නිල් ය. 3) කොළ ය. 4) සුදු ය. 5) කහ ය. (2016)

(74) අනියත නිදානයක් සහිත නිදන්ගත වකුගඩු රෝගය (CKDu) ට දායක වන්නේ යැයි සැක කිරීම නිසා ශ්‍රී ලංකාවේ භාවිතය සීමා කරන ලද කෘමිනාශකයක් වනුයේ,
1) ප්‍රොපනිල් ය. 2) පැරාක්වට් ය. 3) පයිරෙත්‍රොයිඩ් ය.
4) කාබොෆියුරාන් ය. 5) ග්ලයිපොසේට් ය. (2016)

(75) නීති මගින් ශාක රෝග වැළැක්වීම හඳුන්වනුයේ,
1) ශාක විද්‍යාත්මක පාලනය ලෙස ය.
2) රසායනික පාලනය ලෙස ය.
3) ශාක නිරෝධායනය ලෙස ය.
4) ජෛව විද්‍යාත්මක පාලනය ලෙස ය.
5) රෝග ප්‍රතිරෝධීතාව ලෙස ය.

(2016)

(76) වසර ගණනාවක් තිස්සේ නැවත නැවතත් එකම පළිබෝධනාශකය යෙදීම නිසා, එම පළිබෝධනාශකයේ පළිබෝධ විනාශ කිරීමේ කාර්යක්ෂමතාවය ක්‍රමයෙන් හීනවන බව නිරීක්ෂණය කර ඇත. මේ සඳහා හොඳම පැහැදිලි කිරීම වනුයේ,

1) රසායනික අණු බිඳවැටීම නිසා ඕනෑම රසායනිකයක ප්‍රබල බව යම් කාලයකට පසුව අඩු වේ.
2) පළිබෝධනාශකයේ නිෂ්පාදකයන් සිය ලාභය වැඩි කර ගැනීම සඳහා පළිබෝධනාශක වඩ වඩාත් තනුක කිරීමට පෙළඹේ.
3) පළිබෝධ විශේෂවල ප්‍රවේණිකව ප්‍රතිරෝධී සාමාජිකයන් නොතැසී පවතින අතර, ඔවුන් ප්‍රජනනයෙන් බිහි කරන ගහනය පළිබෝධනාශකයට වඩාත් ප්‍රතිරෝධී වේ.
4) පළිබෝධනාශක යෙදූ ප්‍රදේශ මගහැරීමට කෘමි විශේෂ ඉගෙන ගන්නා බැවින් ඔවුන් රසායනිකවලට නිරාවරණය වීම ප්‍රමාණවත් නොවේ.
5) මිනිසුන් එන්නත් මගින් රෝගයකට ප්‍රතිශක්තියක් ඇති කර ගන්නා ආකාරයට ම කෘමීන් ක්‍රමික ව විෂවල බලපෑමට ප්‍රතිශක්තියක් ඇති කරයි. (2016)

(77) ශ්‍රී ලංකාව තුළ හඳුනා ගෙන ඇති ආක්‍රමණශීලී ආගන්තුක ශාක වනුයේ,

1) *Mimosa pigra* සහ *Eichhornia crassipes* ය.
2) *Ischaemum rugosum* සහ *Mimosa pigra* ය.
3) *Cyperus rotundus* සහ *Ischaemum rugosum* ය.
4) *Echinochloa crus-galli* සහ *Cyperus rotundus* ය.
5) *Echnochloa crus-galli* සහ *Eichhornia crassipes* ය. (2016)

II ඒකකය
පළිබෝධ කළමණාකරණය

(1)	4	(2)	1	(3)	4	(4)	2	(5)	3	(6)	1	(7)	4	(8)	3
(9)	5	(10)	1	(11)	5	(12)	4	(13)	5	(14)	4	(15)	5	(16)	5
(17)	2	(18)	5	(19)	5	(20)	5	(21)	3	(22)	2	(23)	1	(24)	2
(25)	4	(26)	3	(27)	4	(28)	4	(29)	4	(30)	2	(31)	5	(32)	2
(33)	4	(34)	4	(35)	3	(36)	3	(37)	3	(38)	5	(39)	1	(40)	4
(41)	1	(42)	4	(43)	2	(44)	5	(45)	4	(46)	5	(47)	5	(48)	1
(49)	5	(50)	2	(51)	1	(52)	4	(53)	4	(54)	2	(55)	3	(56)	3
(57)	3	(58)	1	(59)	4	(60)	3	(61)	2	(62)	4	(63)	4	(64)	4
(65)	1	(66)	4	(67)	4	(68)	2	(69)	1	(70)	5	(71)	3	(72)	1
(73)	1	(74)	4	(75)	3	(76)	3	(77)	1						